19 වන පිටෙන්

මොකද සමානාත්මතාවය වත්මන් ව්‍යවස්ථාවේ පවා මූලික අයිතිවාසිකමක් වශයෙන් ඇතුළත් වන නිසා. කෙසේ වුවත් මේ දෙකෙන් නව ව්‍යවස්ථාවට ඇතුල් කරන්නේ කවර යෝජනාවද කියන එක තෝරාගැනීම සිදුකරන්නේ පාර්ලිමේන්තුව විසින් මිස මෙහෙයුම් කමිටුව විසින් නොවෙයි.

**රටේ ඒකීය භාවයට හානි කරන, බෙදුම්වාදයට පාර කැපෙන යෝජනාත් මෙහෙයුම් කමිටු වාර්තාවට ඇතුළත්ව ඇති බවට බරපතල චෝදනාවක් ඒකාබද්ධ විපක්ෂයෙන් එල්ල වෙනවා නේද ?**

එයට හේතුවී ඇත්තේ භාෂා පරිවර්ථනයේ ප්‍රශ්නයක්. සිංහල භාෂාවෙන් ''ඒකීය'' රටක් යන වචනය යොදා තිබෙනවා. ඉංග්‍රීසි පිටපතේදී ''ඒකීය'' යන්නට යොදා තියෙන්නේ ''යුනිටරි'' (Unitary) යන වචනයයි. දෙමළ පිටපතේදී ''ඒකීය'' යන්නට 'ඔරුමිත්තනාඩු' යනුවෙන් යොදා තිබෙනවා. සිංහල භාෂාවෙන් ඒකීය යන අදහස නිරූපනය වන ඉංග්‍රීසි සහ දෙමළ

සාකච්ඡා කර අවසන් තීරණයට එළැඹිය හැකියි.

**බලය බෙදීම සහ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පදනම් කරගත් මෙම අතුරු වාර්තාව බෙදුම්වාදයට පාර කපන්නක් බවට එල්ල වන චෝදනාව ගැන ඔබේ ප්‍රතිචාරය කුමක්ද?**

මම ඒ චෝදනාව ප්‍රතික්ශේප කරනවා. බෙදුම්වාදයට පාර කැපෙන්නේ බලය නොබෙදුවොත්. මෙහෙයුම් කමිටුව වඩාත් පුළුල් ලෙස බලය බෙදීමක් යෝජනා කරනවා. අනුපූරකතා මූලධර්මය මත බලය ගමට ගෙනයන්නයි කමිටුව යෝජනා කොට තිබෙන්නේ. සමහර නීති ක්‍රියාත්මක කිරීමට පළාත් සභාවලට දීමට කමිටුව යෝජනා කරනවා. ඇතැම් පළාත්වල ජනවර්ග කුඩා ප්‍රමාණයන්ගෙන් ඒකරාශීවී ජීවත්වෙනවා. වවුනියා දකුණ, පානම, ලාහුගල, සිංහල ජනයා වැඩි ප්‍රදේශ තිබෙනවා. බේරුවල මුස්ලිම් ප්‍රදේශ, කල්මුණේ මුස්ලිම් ප්‍රදේශ අතර දෙමළ බහුතරයක් වෙසෙන ප්‍රාදේශීය සභා තිබෙනවා. ඒවාටත් යම් බලය දීමක් කමිටුව යෝජනා කරනවා. එලෙස පහළ

> *ආසන සහ සමානුපාතික ක්‍රම දෙක එක් කළ වඩා හොඳ ක්‍රමයක් කමිටුව යෝජනා කර තිබෙනවා.*

භාෂාවේ එම වචන අතුරු වාර්තාවේ ඉංග්‍රීසි සහ දෙමළ භාෂා පිටපත්වල ඇතුළත් කොට තිබෙනවා. එම ඉංග්‍රීසි සහ දෙමළ වචන අල්ලාගෙන තමයි ඔය චෝදනාව එල්ල කරන්නේ. මේ කාරණයත් මෙහෙයුම් කමිටුවේ සාකච්ඡාවට ලක්වුණා. එහිදී දෙමළ ජාතික සන්ධානයේ එම්. සුමන්තිරන් මන්ත්‍රීතුමා යෝජනා කළා ඉංග්‍රීසි පිටපතටත් Unitary කියන වචනය වෙනුවට ''ඒකීය'' කියන වචනයම සිංහල භාෂාවෙන් ඇතුල් කරමු එතකොට මේ ප්‍රශ්නය මතුවෙන්නේ නෑ කියා. එලෙස වෙනත් භාෂාවක වචනත් ඇතුළත් කර සකස් කළ ව්‍යවස්ථාවන් සහිත රටවල් ලෝකයේ තිබෙනවා. එනිසා අපිටත් අවශ්‍ය නම් ඉංග්‍රීසි සහ දෙමළ පිටපත් දෙකටත් ''ඒකීය'' කියන සිංහල වචනය ඇතුළත් කිරීමට හැකියි. ඒ ගැනත් පාර්ලිමේන්තුවේ

මට්ටම දක්වාම බලය බෙදීමක් සිදුවුව හොත් බෙදුම්වාදයට තියෙන ඉඩත් ඇහිරෙනවා මිස අලුතෙන් බෙදුම්වාදයක් ඇතිවෙන්නට හේතුවක් නෑ.

අනෙක විධායක ජනාධිපති ධුරයක් තිබීමෙන් බෙදුම්වාදයට පාර කැපෙන්නේ නෑ කියලා තර්ක කරන්න පුලුවන් කමක් නෑ. මේ බලගතු විධායක ජනාධිපති ධුරය ඇති කළාට පසුවයි උතුරේ බෙදුම්වාදී ව්‍යාරය තුළ එල්ටීටීඊ සංවිධානය මතුවෙලා තිස්වසරක බිහිසුණු යුද්ධයකට රට මුහුණ දෙන්නේ. බෙදුම්වාදයට වැටී තිබුණු අඩි පාර මහා පාරක් බවට පත්වෙන්නේ.

**කොහොම වුණත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛව තවත් කුඩා පක්ෂ ගණනාවක් විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවාට විරුද්ධත්වය පලකරලා තිබෙනවා. ඒ තත්ත්වය යටතේ ජනවාරි 8 වෙනසේදී ජනතාවට විධායක ජනාධිපති ධුරය අහෝසි කරන බවට දුන් පොරොන්දුව ඉටු කිරීමට නව ව්‍යවස්ථාවෙන් ඉඩක් ලැබෙයිද?**

## CARTOON



විධායක ජනාධිපති ධුරය තිබිය යුතු බවට ඒ පාර්ශ්වයන් ඉදිරිපත් කරන කරුණු පිළිගත හැකි ඒවා නොවෙයි. කෙසේ වුවත් මේ අයගේ විරෝධතාවය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට බලපෑමක් කරනවා. මොකද නව ව්‍යවස්ථාවට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයක් අවශ්‍ය වන නිසා. එනිසා අපි කියන්නේ විධායක ජනාධිපති ධුරය කලින් තිබුණා වගේ ගොපල්ලව පන්නයේ නාමික එකක් බවට පත් කරන්නම අවශ්‍යය නැහැ. එයට කිසියම් ප්‍රමාණයක විධායක බලතල තිබුණාට කමක් නෑ. එහෙත් එම බලතල ක්‍රියාත්මක කිරීම අගමැතිවරයාගේ උපදෙස් මත සිදුවිය යුතු බවයි. විශේෂයෙන්ම මෙහිදී අපි අවධාරණය කරනවා ජනාධිපතිවරයා මහජනයාගේ සෘජු ඡන්දයෙන් පත් නොවිය යුතුයි කියන කාරණය. ජනාධිපතිවරයා ජනතාවගේ සෘජු ඡන්දයෙන් පත් කෙරෙනවා නම් යම් කිසි නිශ්චිත අවස්ථාවකදී පාර්ලිමේන්තු බලයට අභියෝග කරන්නට ජනාධිපතිවරයාට හැකියාව ලැබෙනවා. අගමැතිවරයාට තියෙන්නේ එක් ඡන්ද කොට්ඨාශයකින් ලැබුණු මනාප විතරයි ජනාධිපතිවරයාට මුළු රටෙන්ම ඡන්ද ලැබී තිබෙනවාය කියන තර්කය ඉදිරිපත් කරමින් අගමැතිවරයාගේ බලයට අභියෝග කරන්න ජනාධිපතිවරයාට හැකියාව ලැබෙනවා. එසේ වීමට ඉඩ තිබිය යුතු නෑ.

**බලය බෙදීමේදී පළාත් සභාවලට මොකද වෙන්නේ?**

පවතින ප්‍රායෝගික තත්ත්වයන් තුළ පළාත් සභා අහෝසි කිරීමක් කිසිසේත් සිදුවන්නේ නෑ. පළාත් සභාවලට පුළුල් බලය බෙදීමක් තමයි කමිටුව යෝජනා කරන්නේ. මෙහෙයුම් සහ අනුකමිටුවලට බලය බෙදීමේ හොඳම යෝජනා ඉදිරිපත් කෙරුණේත් පළාත් සභාවලින්. උතුරු නැගෙනහිර නොවෙයි දකුණේ මහ ඇතිවරුන්ගෙන්. හේතුව ඔවුන් සතුව අවුරුදු තිහක අත්දැකීම් තිබීමයි. ප්‍රාදේශීය සංවර්ධනයේ මෙවලමක් ලෙස පළාත් සභා යොදාගැනීමට දකුණේ මහඇමැතිවරු යෝජනා කළා. බලය බෙදීම පැහැදිලි කරන්නැයි යෝජනා කළා. ජාතික ප්‍රතිපත්ති හැදීමට ඔවුන්ගෙන් විරුද්ධත්වයක් නෑ. නමුත් ඒවා හදන විට පළාත් සභාත් සම්බන්ධ කරගෙන හදන්න කියලයි කියන්නේ. ලෝකයේ සෑම තැනකම වන්නේ එහෙම තමයි. එසේ වූ විට ඔවුන්ද එම ප්‍රතිපත්තියේ අයිතිකරුවන් බවට පත්වෙනවා. කිසිවෙක් විරුද්ධ වෙන්නේ නෑ. බලෙන් පැටවීමක් සිදුවන්නේත් නෑ. උතුරු පළාත් සභාවට තවම අවුරුදු හතරයි. නැගෙනහිරට අවුරුදු දහයයි. එනිසා ඒවාට ලොකු අත්දැකීම් නෑ. ඉදිරිපත් කළ යෝජනාත් එතරම් හොඳ යෝජනා නොවෙයි.

**ආණ්ඩුකාරවරයාගේ බලතල සම්බන්ධයෙන් මහ ඇමැතිවරුන්ගේ විරෝධයක් තිබෙනවා නේද?**

ආණ්ඩුකාරවරයාගේ බලයට යම් සීමාවක් දැමිය යුතු බවයි ඔවුන් කියන්නේ. දැනටත් ආණ්ඩුකාරවරයා කටයුතු කළ යුත්තේ මහ ඇමැතිවරයාගේ උපදෙස් පිට නමුත් පනතේ එක් තැනෙක මෙහෙම තියනවා. ''උපදෙස් පිට කරන්නේද නැත්ද යන්න තීරණය කරන්නේත් ආණ්ඩුකාරවයා'' කියා. අනෙක ජනපතිටවත් නැති මුක්තියක් ආණ්ඩුකාරවරයාට ලැබී තිබෙනවා. එය තමයි පළාත් රාජ්‍ය සේවයේ පත් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය කිරීම් සියල්ල ආණ්ඩුකාරවරයා යටතට පත්කොට තිබීම. පළාත් රාජ්‍ය කොමිසමේ තීරණවලට එරෙහි අභියාචනා යන්නේත් ආණ්ඩුකාරවරයාට. එය භයානකයි. බොහෝ දෙනෙක් මේ බලය අනිසි ලෙස භාවිතා නොකළත් සමහරු එහෙම කරනවා. ටිකිරි කොබ්බෑකඩුව මධ්‍යම ආණ්ඩුකාරවරයාව සිටියදීම ශ්‍රීලනිප සංවිධායකවරුයෙකු ලෙසත් කටයුතු කළා. එතකොට ආණ්ඩුකාරවරයා ස්වාධීන පුද්ගලයෙක් වෙන්නේ නෑ. ආණ්ඩුකාරවරුන් සතු මේ බලය අයින් කරන ලෙස සියලුම පළාත් සභා ඉල්ලා තිබුණා. නමුත් ඒ බලය ඔවුන්ට දෙන්නැයි ඉල්ලුවේ නෑ. ලේකම්වරුන් පත් කිරීමේ බලය පමණක් පළාත් සභාවට ඉල්ලුවා.

**ඉඩම් බලතල පළාත් සභාවලට පැවරීමෙන් ගැටළු ඇතිවීමට ඉඩ තිබෙනවා නේද?**

මධ්‍යම රජයේ කටයුතු සඳහා පළාත් ඉඩම් ලබාගැනීම ගැටළුවක් නොවන ලෙසටයි ඒ පැවරීම කරන්නේ. රෝහලකට, විශ්වවිද්‍යාලයකට වැනි පොදු අවශ්‍යතාවන්ට ඉඩම් ගන්න අවශ්‍ය වුණොත් මධ්‍යම රජයට ඒ සඳහා බලය හිමිවෙනවා. ඒ වගේ දෙයකට පළාත් සභාවක් ඉඩම් නොදී ඉන්නෙත් නැහැ. හමුදා කඳවුරකට ඉඩම් ඉල්ලුවොත් ගැටළුවක් මතුවිය හැකියි. ඒකටත් විසඳුම් මෙවර දී තිබෙනවා. ජාතික ආරක්ෂාවට අදාළ කටයුතුවලට පළාත් සභා නොවිමසා පළාත් ඉඩම් ගත හැකි වගන්ති ව්‍යවස්ථාවට ඇතුළත් කරන්නට යෝජනා කර තිබෙනවා. එහෙත් ඒ පවරා ගැනීම අත්තනෝමතික නම් ගත්තාට පසුව එයට එරෙහිව අධිකරණයට යාමට පළාත් සභාවට හැකියාව තිබෙනවා.

**දෙවන මන්ත්‍රී මණ්ඩලයකුත් යෝජනා වෙනවා නේද?**

බලය බෙදා හැරුණු බොහෝ රටවල දෙවෙනි මන්ත්‍රී මණ්ඩල තිබෙනවා. ප්‍රාන්ත, කේන්ද්‍රයේ හවුල්කරුවන් කිරීම සඳහායි දෙවන මන්ත්‍රී මණ්ඩලයක් ඇති කරන්නේ. එමගින් පර්යන්තය දුර්වල නොවී කේන්ද්‍රය ශක්තිමත් කෙරෙනවා. හැම පළාතකින්ම පස් දෙනෙක් දෙවෙනි මන්ත්‍රී මණ්ඩලයට ඇතුළත් කරන්න අපි යෝජනා කොට තිබෙනවා. එතකොට සියල්ල 45 ක්. පාර්ලිමේන්තුවෙන් තව 10ක් පත් කරනවා. වැදි ජනයා, මැලේ ජාතිකයන් වැනි ජනයා නියෝජනයට. ඉන්දියාවේ නම් ඕනෑම පනතක් දෙවන මන්ත්‍රී මණ්ලයෙන්ද අනුමත විය යුතුයි. අපේ යෝජනාව වන්නේ එසේ නොවේ. යම් පනත් දෙවෙනි මන්ත්‍රී මණ්ඩලයේ සළකා බැලීමට යැවිය හැකියි යන්නයි.

**මැතිවරණ ක්‍රමය?**

ආසන සහ සමානුපාතික ක්‍රම දෙක එක් කළ වඩා හොඳ ක්‍රමයක් කමිටුව යෝජනා කර තිබෙනවා. එහිදී ඡන්දදායකයෙකුට ඡන්ද දෙකක් හිමිවෙනවා. එකක් තමන් කැමැති පක්ෂයට. අනෙක තමන් කැමැති අපේක්ෂකයාට. එවිට එක් පක්ෂයකට ඡන්දය දී වෙනත් පක්ෂයක අපේක්ෂකයෙකුට ඡන්දය දීමටත් හැකියාව ලැබෙනවා. පාර්ලිමේන්තුවේ ආසන සංඛ්‍යාව තීරණය වන්නේ පක්ෂ ලබන ඡන්ද අනුවයි. ඒ ආසන සංඛ්‍යාවට පක්ෂවලින් වැඩි ඡන්ද ලබාගත් අපේක්ෂකයන් මන්ත්‍රීවරුන් ලෙස පත් කෙරෙනවා.

සාකච්ඡා කළේ
ශ්‍රීලාල් සෙනෙවිරත්න